ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 2477424, 2477423, 2477311
ෆැක්ස්ඃ 2346257, 2477739
ඊ-මේල්ඃ dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියඃ www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ ප්‍රාදේශීය කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව

දිනය 05.05.2015

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලයක් කිලිනොච්චි හිදී විවෘත කරේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නවතම ප්‍රාදේශීය කාර්යාලය කිලිනොච්චි අරිවියල් නගර් හි ස්ථාපිත කොට ඇති අතර එහි රාජකාරි කටයුතු 2015 මැයි මස 06 වෙනි දින ආරම්භ කිරීමට නියමිතයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා හා මුදල් මණ්ඩලයේ ආරාධනය පරිදි නැවත පදිංචි කිරීම් ප්‍රතිසංස්කරණ හා හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු. ඩී. එම්. ස්වාමිනාදන් සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා යන මැතිතුමන්ලා විසින් මෙම ප්‍රාදේශීය කාර්යාලය උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබේ. උතුරු පළාත නියෝජනය කරන පාර්ලිමේන්තු ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු සහ මන්ත්‍රීවරු, උතුරු පළාතේ ආණ්ඩුකාර තුමා, උතුරු පළාත් සභාව නියෝජනය කරන මැති ඇමතිවරු, ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, මූල්‍ය සහ අනෙකුත් ආයතන වල උසස් නිලධාරීන් මෙම උත්සවයට සහභාගී වේ.